ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය - 2010
-------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්.

1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

2010 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.371,946,503 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 15 ක් ක්ෂය අඩු කළ වටිනාකම ශූන්‍ය වී තිබුණ නමුත් ඒවා නොකඩවා ප්‍රයෝජනයට ගනු ලබන හෙයින්, එම වත්කම් ප්‍රත්‍යාගණනය කර, එම වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන වටිනාකම රු.2,483,241 ක්වූ ස්ථාවර වත්කම් වර්ග 07 කට අදාලව නැතිවීම්, ඌනතාවයන් ප්‍රයෝජනයට ගත නොහැකි හා අතිරික්තයන් සම්බන්ධයෙන් ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, වටිනාකම රු.39,050 ක් වූ ඉවත් කළ භාණ්ඩ ඒකක 19 ක වටිනාකම ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාළව උපචිත පදනම මත ගැළපුම් කළයුතු රු.203,391 ක වියදම් ප්‍රවර්ථන වර්ෂය තුළ වැය කිරීමේ දි, ආයතන අරමුදලට ගැලපීමෙන් තොරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගැලපීම හේතුවෙන් වර්ෂයේ ශුද්ධ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

(ඇ) ඉදිරි වර්ෂය සඳහා නිලධාරීන් වෙත ගෙවියයුතු උත්සව අත්තිකාරම් වෙනුවෙන් රු.300,000 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව වෙන් කොට තිබූ අතර, එම මුදල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

1.2.3 නොසැසඳීම්

--------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් අයිතම 04 ක මූල්‍ය ප්‍රකාශනයේ සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන වටිනාකම් අතර රු.126,325 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන තොග අයිතම 04 ක භෞතික ශේෂ සහ තොග පොත් වටිනාකම් අතර රු.5,247 ක වෙනසක් ද, තොග අයිතම 05 කට අදාළව භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සහ මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන වටිනාකම් අතර රු.49,419 ක වෙනසක් ද නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විදේශීය මිලදී ගැනීම් සඳහා මාණ්ඩලික ගණයේ නිලධාරීන් වෙත අවස්ථා 24 කදී ගෙවන ලද රු.613,786 ක තත්කාර්ය අතුරු අග්‍රිම වර්ෂ 04 සිට 16 දක්වා කාල පරාසයක සිට නිරවුල් කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) සැපයුම් සහ සේවා සඳහා වූ ණයහිමි උපලේඛනයේ සඳහන් වසර 03 කට අධික කාලයක සිට පැවත එන එකතුව රු.5,300 ක් වූ ශේෂයන් 02 ක් සහ වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.4,575 ක් වූ ශේෂයන් 02 ක්, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී ඇති රු.112,044 ක වෙනත් ණයහිමි ශේෂ 05 ක් සහ රු.27,457 ක් වටිනාකමින් යුතු වර්ෂ 04 කට වඩා පැරණි වෙනත් වියදම් ශේෂ 02 ක් ද, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගිණුමේ දක්වා ඇති රු. 768,629 ක් වූ ණයහිමි හා උපචිත වියදම් ශේෂ 22 ක් සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා , එම ශේෂවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------------

රු. 2,020,836 ක් වූ විශ්‍රාමලත් සාමාජිකයින්ගේ අරමුදල් ගිණුමේ ශේෂයේ නිවැරදිතාවය විශ්‍රාමික සාමාජිකයින් පිළිබඳ විස්තර, 2010 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ආදිය නොමැතිවීම හේතුවෙන්, විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.2.6 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------------

පහත සඳහන් නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 03 සහ 04(අ) හා (ඌ) වගන්ති. | පර්යේෂණ කාර්යයන් ඉටු කිරීම සඳහා රීතිමාලා සම්පාදනය කොට, අනුමත කර ගෙන නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 396(ඈ) | නිකුත් කර මාස 06 ඉක්මවා ගෙවීමට ඉදිරිපත් නොකළ එකතුව රු.5,895 ක් වු චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | අංක 01/2001 හා 2001 ජුලි 17 දිනැති මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස්ගේ චක්‍රලේඛ ලිපිය. | රු.201,432 ක මිල දී ගැනීම් වෙනුවෙන් රු.2,014 ක පිරිවැටුම් බදු අය කර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) | ආපනශාලාව පවත්වා ගෙන යාමේ ගිවිසුමේ 17 වන වගන්තිය. | ආයතනය සතු උපකරණ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් ආපනශාලා කොන්ත්‍රාත්කරුගෙන් රු.100,000 ක රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

-----------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය.

----------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල.

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් ලැබූ මූල්‍ය ප්‍රතිඵලය රු.7,154,194 ක ඌනතාවයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.143,221 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,297,415 ක පිරිහීමක් සඳහා පෞද්ගලික පඩිනඩි රු.12,524,447 කින් සහ නඩත්තු වියදම් රු. 2,923,119 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය.

------------------------------

2.2.1 කාර්යය සාධනය.

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පිහිටුවීමට අදාළ පනතට, සංශෝධිත 1997 අංක 05 දරන පනතේ 2 (4) වගන්ති ප්‍රකාරව, ජාතික අවශ්‍යතාවයන් පිළිබඳ සැලැකිළිමත්වීම සඳහා එහි ආරක්ෂාකාර බව වැඩි දියුණුවීම සැළසෙන පරිදි කටයුතු කළයුතු බව දක්වා ඇතත් ආයතනය විසින් කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති ජාතික අවශ්‍යතාවයන් ඉටු වන පරිදි සකස් වී නොමැති අතර, එහි ආරම්භයේ සිටම සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 04 ක් හැර සෙසු පර්යේෂණවල අවසාන ප්‍රතිඵල ප්‍රායෝගිකව එම විෂය ක්ෂේත්‍රයන් හී වැඩි දියුණුව සඳහා භාවිතා කර නොතිබූ බව අනාවරණය විය. එසේම, එම පර්යේෂණයන්වලට අදාළ පේටන්ට් බලපත්‍ර ලබා ගෙන ඇත්තේ එක් පර්යේෂණයකට අදාළව පමණක් බව ද නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂය තුළ දේශීය හා විදේශීය සඟරාවල පල කළ මුළු පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව 41 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ කටයුතුවල නිරත වූ කාර්ය මණ්ඩලය සඳහා දරන ලද වේතන හා පර්යේෂණ දීමනා වියදම රු.24,885,818 ක් විය. එය පළ කළ මුළු ප්‍රකාශන සංඛ්‍යාවට සාපේක්ෂව එක් ප්‍රකාශනයක සාමාන්‍ය වියදම රු.606,971 ක් පමණ විය.

(ඇ) පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කර, වසර 10 සිට 23 අතර කාල පරිච්ඡේදයක් ගත වී ඇතත්, අවසන් වී නොමැති පර්යේෂණ 20 ක් පැවති බව 2011 මැයි මස 30 වන දින සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවකට අනුව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ ව්‍යාපෘතිවල නියැලුණු විද්‍යාඥයින් පර්යේෂණ සහායකයින්, තාක්ෂණික ශිල්පීන් ඇතුළු පර්යේෂණ කාර්යය මණ්ඩලය උදෙසා වැටුප් හා පර්යේෂණ දීමනා වෙනුවෙන් පිළිවෙළින් රු.35,922,063 ක් හා රු.5,122,085 ක් වශයෙන් රු.41,044,148 ක වියදමක් දරා තිබුණ ද, දේශීය අවශ්‍යතා හඳුනාගෙන පර්යේෂණ සිදු කරනු ලැබුවේද යන්නත් එම පර්යේෂණ තුලින් සමාජයට හා ප්‍රජාවට ලබාදුන් දායකත්වය කෙබඳුද යන්න පිළිබඳව ඇගයීමක් සිදු කර නොතිබුණි.

2.2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
------------------------------

1993 සිට 2000 වර්ෂය දක්වා කාල සීමාව තුළ මුද්‍රණය කරන ලද රු.810,061 ක වටිනාකමකින් යුත් පර්යේෂණ ප්‍රකාශන 6877ක් 2010 දෙසැම්බර් 31 දිනට නොවිකිණි ඉතිරිව තිබුණි.

2.2.3 ආර්ථික නොවූ ගනුදෙනු
---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1989 අගෝස්තු 13 දින "පොප්හැම් ආර්බෝටම් හා වුඩ් ලැන්ඩ්ස්" වත්ත මිල දී ගැනීම පිණිස රු.140,000 ක්ද, ඊට අදාළ නීති වියදම් සහ පාරිතෝෂික මුදල් ලෙස රු.312,387 ක මුදලක් ද, 1989 සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා එහි නඩත්තු කටයුතු සහ සේවක පඩිනඩි වෙනුවෙන් රු.2,671,122 ක මුදලක් ද, ආයතනය විසින් වැය කර ඇතත්, 2005 මැයි 01 දින සිට 2025 අප්‍රේල් 30 දින දක්වා වසර 20 ක කාලයකට මෙම වත්තේ පරිපාලනය අවබෝධතා ගිවිසුමක් මගින් සංවිධානයක් වෙත පවරා දී තිබුණි. එම ගිවිසුම අනුව, ආයතනයට කිසිදු ප්‍රතිලාභයක් නොලැබෙන අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, මෙම ඉඩම අපේක්ෂිත පර්යේෂණ කටයුතු සඳහා උපයෝගී කර ගෙන නොතිබුණි. අදාළ වත්තේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය දක්වා ම පිළියෙළ කරන ලද ගිණුම් ප්‍රකාශන විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආයතනයේ නිලධාරීන් සඳහා තේ සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.358,553 ක මුදලක් වැය කර ආයතනයේ වියදමින් ජලය සහ විදුලිය සපයා දී තිබියදී ආපනශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට මාසිකව රු.25,000 බැගින් ගෙවීමට ගිවිසුම්ගතවී තිබුණි. මේ හේතුවෙන් 1999 සිට 2010 වර්ෂය දක්වා ආපනශාලා කොන්ත්‍රාත්කරුට රු.3,970,003 ක මුදලක් ගෙවීම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

2.2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

-----------------------------------------

වර්ෂ 20 කට අධික කාලයක සිට ප්‍රයෝජනයකට නොගත් වටිනාකම රු.71,135,242 ක්වූ රසායනාගාර සහ අනෙකුත් උපකරණ වර්ග 06 ක් ආයතනයේ පර්යේෂණාගාරවල නිෂ්ක්‍රීයව පැවතුණි.

2.2.5 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම.

-------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි ආයතනයේ සංයුක්ත සැලැස්ම ප්‍රධාන සංරචකයන් යටතේ පිළියෙළ කර නොතිබු අතර, ඒ සඳහා පාලක සභා අනුමැතියක්ද ලබා ගෙන නොතිබුණි.

2.2.6 විගණන හා කළමනාකරණ කමිටු.

-----------------------------------------

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය අනුව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04 වරක් පැවැත්විය යුතු වුවත්, 2010 වර්ෂය වෙනුවෙන් එක් රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

2.2.7 අභ්‍යන්තර විගණනය.

--------------------------

මුදල් රෙගුලාසි 134(2) හා (3) ප්‍රකාර ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

2.2.8 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 පරිච්ඡේදය පරිදි මානව සම්පත් පාලනය පිණිස අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

2.2.9 අයවැය ලේඛනමය පාලනය.
---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී වැය විෂයයන් 07 කට අදාළව 13% සිට 95% දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලක කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 03 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා රු.1,567,000 ක් වියදම් දරා තිබුණු අතර, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන.
---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ලේඛන පැවැත්වීම
(ඇ) තොග පාලනය
(ඈ) පර්යේෂණ පැවැත්වීම